සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

**32 | S | I**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

**Third Term Test - Grade 13 - 2016**

විභාග අංකය ............................ **ව්‍යාපාර අධ්‍යයනය I** කාලය පැය දෙකයි

**උපදෙස්**

- ♦ සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ♦ ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ♦ ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.
- ♦ සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

(1) ප්‍රශන්න සිංගප්පූරුවේ සිට පරිඝණක උපාංග ආනයනය කොට මෙරට දී එකලස් කොට රට පුරා පිහිටි තම නියෝජිත මධ්‍යස්ථාන හරහා පරිඝණක විකිණීම සිදුකරයි. මෙම ව්‍යාපාරය පිළිබඳ රූපවාහිනිය මගින් ප්‍රචාරය කිරීමත් පහසු ගෙවීමේ ක්‍රමයට පරිඝණක ලබාදීමත් බැංකු මගින් මුදල් රැස්කිරීමත් සිදුකරයි. මෙම සමස්ථ ක්‍රියාවලිය හැඳින්විය හැක්කේ,

(1) වෙළඳාම ලෙසය (2) ආනයනය ලෙසය (3) ව්‍යාපාර ලෙසය
(4) කර්මාන්ත ලෙසය (5) වාණිජ්‍යය ලෙසය (.........)

(2) කාර්මික නිෂ්පාදන පමණක් ඇතුලත් බාණ්ඩය තෝරන්න.
(1) ආහාර පාන/ඉදිකිරීම්/වන/රෙදිපිළි හා ඇඟළුම්
(2) පතල් හා කැනීම් /තේ/ධීවර/නිමවුම්
(3) ආහාර පාර/රෙදිපිළි හා ඇඟළුම්/දැව නිෂ්පාදිත/රබර් නිෂ්පාදිත
(4) විදුලිය හා ගෑස් /පතල් හා කැනීම්/ධීවර/ඉදිකිරීම්
(5) ගබඩා/රසායනික ද්‍රව්‍ය/ප්‍රවාහනය/කඩදාසි නිෂ්පාදිත (.........)

(3) වඩාත්ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මුදල් භාවිතය නිසා වෙළඳාම ඇතිවිය (2) භාණ්ඩ හුවමාරුව නිසා වෙළඳම ඇතිවිය.
(3) ඍජු නිෂ්පාදනය නිසා වෙළඳාම ඇතිවිය. (4) වක්‍ර නිෂ්පාදනය නිසා වෙළඳාම ඇතිවය
(5) උපකාරක සේවා නිසා වෙළඳාම ඇතිවිය (..........)

(4) ව්‍යාපාර පරිසර විශ්ලේෂණය සඳහා යොදාගනු ලබන ශ.දු.අ.ත. විශ්ලේෂණයේ ඇති කළමණාකරන ශිල්පය වැදගත්කම වඩාත්ම හොඳින් පිළිඹිබු වන්නේ.
(1) මේ තුළින් කළමණාකරුවන්ට ව්‍යාපාර පරිසරය බෙදා දැක්විය හැකි වීමයි.
(2) කළමණාකරන ක්‍රියාවලියේ පාලන අදියර සඳහා මෙය භාවිතා කල හැකි වීමයි.
(3) කළමණාකරන සැලසුම් සකස් කිරීම හා තීරණ ගැනීමේදි මෙය ඉතා වැදගත් ලෙස උපයෝගි කරගත හැකි වීමයි.
(4) කළමණාකරණ ක්‍රියාවලියේ මෙහෙයවීමේ අදියර සඳහා මෙය ඉතා වැදගත් කමක් ගෙනදීමයි.
(5) මූල්‍ය කළමණාකරන ශිල්ප ක්‍රමයක් ලෙස මෙය යොදාගත හැකිවීමයි. (..........)

(5) පහත සඳහන් ප්‍රකාශ වලින් සත්‍ය වන්නේ.
(1) ගණුදෙනුකරුවන් අභ්‍යන්තර පරිසර සාධකයකි.
(2) සාර්ව පරිසර සාධක ව්‍යාපාරයේ පාලනයෙන් බැහැරව පවති.
(3) සේවකයින් බාහිර පරිසර සාධකයක් ලෙස සැලකේ.
(4) දේශපාලන පාරිසරික වෙනස්කම් ව්‍යාපාර කෙරෙහි බල නොපායි.
(5) පාරිභෝගික ආදායම ඉහළ යාම ව්‍යාපාර වල දුර්වලතාවයකි. (..........)

(6) රජයේ ආර්ථික අරමුණු ඉටුකිරිමට ව්‍යාපාරික ප්‍රජාවට දායකවිය හැකි ආකාරයක් නොවන්නේ.
(1) රජයේ නීතිරීති හා ප්‍රතිපත්ති පිළිපැදීම මගින්
(2) රටේ මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීම තුලින්
(3) සේවා නියුක්තියට දායකවීම තුළින්
(4) නිසි පරිදි බදු ගෙවීම තුළින්
(5) දේශිය සම්පත් භාවිතය හා පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම තුළින් (..........)

(7) රාජ්‍ය ආදායම් රැස් කිරිමට සම්බන්ධ ආයතනයක් නොවන්නේ
(1) මෝටර් රථවාහන දෙපාර්තමේන්තුව
(2) රේගු දෙපාර්තමේන්තුව
(3) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
(4) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
(5) පළාත් සභා හා පළාත් පාලන ආයතන (..........)

(8) පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධාන කිහිපයකි.
A- හවුල් ව්‍යාපාර B- වෘත්තීය හවුල් ව්‍යාපාර. C- සී/ස පෞද්ගලික සමාගම් D- සමූපකාර සමිති
මෙහි අවම හිමිකරුවන් හා උපරිම හිමිකරුවන් නිවැරදිව පෙන්වන පිළිතුරු බාන්ඩය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | A- (2-20) | B -(2-20) | C- (2-50) | D- (7-50) |
| (2) | A- (2-20) | B- (2-20) | C- (2-50) | D-(7- සීමාවක් නැත.) |
| (3) | A- (2-50) | B- (2- සීමාවක් නැත) | C- (2- සීමාවක් නැත) | D- (10-50) |
| (4) | A- (2-20) | B- (2- සීමාවක් නැත) | C- (1-50) | D- (10-සීමාවක් නැත) |
| (5) | A- (2-20) | B- (2-සීමාවක් නැත) | C- (1-50) | D- (7- සීමාවක් නැත) |

(..........)

(9) සමාගමක්අධිකරණය මගින් ගණන් බේරා වසා දමන අවස්ථා පමනක් ඇතුලත් පිළිතුර තෝරන්න.
(A) සමාගම දිගින් දිගටම පාඩු පිට පවත්වාගෙන යාම
(B) සමාගම නීති විරෝධී බවට පත්වීම
(C) සමාගම බංකොලොත් බවට පත්වීම
(D) සමාගමේ අධ්‍යක්ෂවරු එක් අයෙක්වත් නොසිටීම
(E) සාංගමික ව්‍යවස්ථාවලියට අනුව කාලය අවසන් වීම
(1) BCE (2)BCD (3)ABD (4)CDE (5)ADE (.........)

(10) සමහර ව්‍යාපාර පොදු අයිතිය යටතේ පවත්වාගෙන යාමට ප්‍රධාන වශයෙන් බලපාන හේතුව ලෙස සැලකිය හැක්කේ.
(1) සමාජයීය වශයෙන් වැදගත් සේවා සැපයීමට
(2) රැකියා වැඩියෙන් සැපයීමට
(3) රජයට ආදායමක් ලබා ගැනීමට
(4) පෞද්ගලික අංශය පාලනය කිරීමට
(5) දළ ජාතික නිෂ්පාදනයට වන දායකත්වය වැඩි කිරීමට (..........)

(11) කුඩා ව්‍යාපාර සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) නිෂ්පාදන ධාරිතාව අඩුයි.
(2) මහා පරිමාන පිරිමැසුම් දක්නට නොලැබේ
(3) අධික අවදානම් ක්ෂේත්‍රවල කටයුතු කරයි.
(4) සරළ හා සම්ප්‍රදායික ශිල්ප ක්‍රම යොදා ගනි.
(5) ක්ෂේත්‍රයේ කළහැකි බලපෑම අඩුයි. (.........)

(12) ව්‍යවසායකත්ව සංවර්ධනයට බාධා කෙරෙන අභියෝගයක් ලෙස සැලකිය හැක්කේ කුමක්ද?
(1) දෛවය (2) මුදල් (3) පරිසරය (4) තොරතුරු (5) දැනුම (.........)

(13) විවිධ මූල්‍යායතන විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික කටයුතු කිහිපයක් පහත දැක්වේ.
(අ) මූල්‍ය උපදේශක සේවා සැපයීම
(ආ) කල්බදු ණය පහසුකම් හා ණය සම්මේලනය
(ඉ) ගණුදෙනුකරුවන් වෙනුවෙන් තැන්පතු පවත්වාගෙන යාම
(ඊ) ඒක්ෂණ වෙළෙඳපොළට ණය සැපයීම
(උ) ව්‍යාපාර ශක්‍යතා අධ්‍යයනය
මේවායින් ව්‍යාපාරික බැංකු කටයුතු පමණක් ඇතුලත් වන බාණ්ඩය කුමක්ද?
(i) අ,ආ,ඉ (ii)ආ,ඉ,ඊ (iii) ආ,ඊ,උ (iv) අ,ආ,ඊ (v) අ,ඉ,උ (.........)

(14) ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතනයකි.
(1) වාණිජ බැංකු (2) ඉතිරිකිරීමේ බැංකු (3) කල්බදු සමාගම්
(4) රාජ්‍ය සමාගම් (5) සේවක භාරකාර අරමුදල (.........)

(15) පවාරණ අගය ලබා ගැනිමට හිමිකමක් ඇති රක්ෂණ ඔප්පුව වනුයේ.
(1) ජීවිත රක්ෂණ ඔප්පුව (2) මුහුදු උවදුරු රක්ෂණ ඔප්පුව (3) මෝටර් රථ රක්ෂණ ඔප්පු
(4) ගිනි රක්ෂණ ඔප්පුව (5) හදිසි අනතුරු රක්ෂණ ඔප්පුව (..........)

(16) කිසියම් දේපලක් රක්ෂණය කල රක්ෂණ සමාගමක් එම දේපල වෙනත් රක්ෂණ සමාගමක රක්ෂණය කිරිම හදුන්වන්නේ.
(1) ප්‍රා රක්ෂණය ලෙසය (2) ද්විත්ව රක්ෂණය ලෙසය (3) ප්‍රතිරක්ෂණය ලෙසය
(4) අධි රක්ෂණය ලෙසය (5) ඌණ රක්ෂණය ලෙසය (..........)

(17) පහත දැක්වෙන්නේ ජාත්‍යන්තර වෙළඳාමේ ව්‍යාප්තියට එරෙහිව ඇති බාධක කිහිපයකි.
A- භාෂාමය වෙනස්කම් B- තීරුබදු පැනවීම
C- ආර්ථික සම්බාධක පැනවීම D- ආනයන පංගු නියම කිරීම
E- සංස්කෘතිකමය වෙනස්කම් F- විනිමය පාලනය
ඉහත බාධක ස්වභාවික බාධක හා ස්වාභාවික නොවන බාධක ලෙස පිළිවෙලින් වෙන්කල විට ලැබෙන පිළිතුරු කාණ්ඩය වන්නේ.
(1) A,C,D/BEF (2)AE/BCDF (3) AC/BEDF (4) BE/ACD (5) BE/ACDF (.........)

(18)

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. සෞඛ්‍ය සහතිකය<br>2. ප්‍රභවස්ථාන සහතිකය<br>3. සනීපාරක්ෂක සහතිකය | A වාණිජ දෙපාර්තමේන්තුව<br>B සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>C කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ඇති පැලෑටි නිරෝධායන දෙපාර්තමේන්තුව |

X තීරුවේ තොරතුරු Y තීරුවේ තොරතුරු හා ගැළපු විට නිවැරදි පිළිතුර විය යුත්තේ.
(1)ACB (2)BCA (3)ABC (4)CBA (5) BAC (..........)

(19) සංවිධාන කරණයට අදාල කාර්යයකි
(1) මාණ්ඩලීකරණය (2) අභිප්‍රේරණය (3) සන්නිවේදනය
(4) දෙපාර්තමේන්තුකරණය (5) ඇගයීම (..........)

(20) පාලනයේ අරමුණු වන්නේ,
(1) විතැන්වීම හදුනාගෙන ලාභදායිත්වය සහතික කරගැනීමයි.
(2) විතැන්වීම හදුනාගෙන වැඩකටයුතු නැවත සැලසුම් කිරිමයි.
(3) නාස්තිය හදුනාගෙන සේවකයින් නැවත පුහුණු කිරිමයි.
(4) ප්‍රථිඵලවලට සැලසුම් අනුකූලවන බව සහතික කර ගැනීමයි.
(5) සැලසුම්වලට අනුකූලව ප්‍රථිපල ලැබෙන බව සහතික කර ගැනීමයි. (..........)

(21) ස්ථාපිත කරන ලද ප්‍රමිතීන්ට අනුව නිමි භාණ්ඩ නිශ්චිත රටාවකට අනුව පරික්ෂා කිරීමේ ක්‍රියාවලිය හැදින්වෙන්නේ,
(1) තොග පාලනය ලෙසයි. (2) නිෂ්පාදන පාලනය ලෙසයි. (3) නිෂ්පාදන සංවර්ධනය ලෙසයි
(4) නියැදි පරික්ෂාව ලෙසයි. (5) තත්ව පාලනය ලෙසයි (..........)

(22) ඉදිකිරීම් ආයතනයක විශාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් සඳහා වඩා උචිත පිරියත වනුයේ.
(1) ක්‍රියාවලි පිරියතයි (2) නිෂ්පාදිත එකලස් කිරිමේ පිරියතයි. (3) කුටි පිරියතය
(4) ස්ථාවර ස්ථානීය පිරියතයි (5) කාර්ය බද්ධ පිරියතයි (..........)

(23) වෙළෙඳුන් හෙවත් අතර මැදියන් විසින් යොදන සන්නම වනුයේ,
(1) ජාතික සන්නම (2) පෞද්ගලික සන්නම (3) භාණ්ඩ සන්නම
(4) පවුල් සන්නම (5) මිශ්‍ර සන්නම (.........)

(24) පහත සඳහන් වන්නේ වෙළඳපල බන්ධනයට පදනම් වූ සාධක කීපයකි. එම සාධක අතුරින් ප්‍රජාවිද්‍යාත්මක සාධක ඇතුලත් බාන්ඩය ලෙස සැලකෙන ප්‍රකාශය වන්නේ,
A ආදායම B වෘත්තිය C අධ්‍යාපනය Dජාතිය
E සමාජය F පෞරුෂය G ආකල්ප H ප්‍රතිලාභ
(1) A,B,C හා D (2) A,B,C,D හා E (3) A,B,C,D,E,F හා G (4) A,B,C,D හා F (5) A,B හා C (..........)

(25) ආයතනයක තනතුරකට බඳවාගත් නවක සේවකයකු තනතුරේ ස්ථිර කිරීමට පෙර සේවය කලයුතු කාලය හඳුන්වන්නේ,
(1) පරිවාස කාලය ලෙසය (2) ආධුනික කාලය ලෙසය (3) පුහුණු කාලය ලෙසය
(4) සාමාන්‍ය සේවා කාලය ලෙසය (5) ඇගයීම් කාලය ලෙසය. (..........)

(26) මානව සම්පත් සැලසුම් කිරීමේ පියවරයන් පහතින් දැක්වේ
A මිනිස් බල සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
B මානව සම්පත් සැලසුම්කරන ප්‍රයත්න ඇගයීම හා වැඩිදියුණු කිරීම
C අනාගත මානව සම්පත් ඉල්ලුම ප්‍රරෝකථනය
D ගතයුතු උපක්‍රම තීරණය කිරීම
E මානව සම්පත් සැපයුම ඇස්තමේන්තු කිරිම
මානව සම්පත් සැලසුම්කරණයේ පියවරයන් පිළිවෙලින් දැක්වූ විට
(1)ACDBE (2)ABDCE (3) CDABE (4) BCDEA (5)CEDAB (..........)

(27) දැනුම් මට්ටමේ තොරතුරු පද්ධතියකි.
(1) විධායක උපකාරක පද්ධතිය (2) ගණුදෙනු සැකසුම් පද්ධතිය
(3) කාර්‍යාලීය ස්වයංක්‍රීය පද්ධතිය (4) කළමනාකරණ තොරතුරු පද්ධතිය
(5) තීරණ උපකාරක පද්ධතිය (..........)

(28) භාවිත කරන පාර්ශ්ව අනුව පරිඝනක ජාල වර්ග කර ඇති ආකාරය නිවැරැදිව දැක්වෙන පිළිතුර වන්නේ.
(1) ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාලය සහ පුළුල් ක්ෂේත්‍ර ජාලය (2) අභ්‍යන්තර ජාලය සහ භාහිර ජාලය
(3) මුදු ජාල හා තරු ජාල (4) ඉන්ටර්නෙට් සහ පුළුල් ක්ෂේත්‍ර ජාල
(5) ඉන්ට්‍රානෙට් සහ ඉන්ටර්නෙට් (.........)

(29) ව්‍යාපාරයක හිමිකරුගේ ජීව දත්ත විස්තරය ඇතුළත් කිරීම වඩාත් සුදුසු වන්නේ ව්‍යාපාර සැලැස්මක
(1) ව්‍යාපාර විස්තරයේය. (2) මෙහෙයුම් සැලැස්මෙහිය. (3) අලෙවි කරණ සැලැස්මෙහිය.
(4) මානව සම්පත් සැලැස්මෙහිය. (5) උපග්‍රන්ථයෙහිය. (.........)

(30) සමස්ථ සැලැස්ම පිළිබඳ අවබෝධයක් ලබාදෙන කියවන්නා ආකර්ෂණය කරන ව්‍යාපාර සැලස්මේ උප කොටස වනුයේ.
(1) විධායක සාරාංශයයි. (2) ව්‍යාපාර විස්තරයයි. (3) අලෙවි සැලැස්මයි
(4) මානව සම්පත් සැලැස්මයි (5) මූල්‍ය සැලැස්මයි. (.........)

- **අංක 31 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(31) (අ) ව්‍යාපාරයක පරමාර්ථ ලඟාකර ගැනීමට බාධා ඇති කරන අභ්‍යන්තර පාරිසරික ගත් ලක්ෂණ .................................................. ලෙසත් බාහිර පාරිසරික ගති ලක්ෂණ ............................................................ ලෙසත් හඳුන්වනු ලබයි.

(ආ) සංවිධානයක බලතල හා සම්පත් බෙදී ඇති ආකාරය දෙපාර්තමේතු බෙදී ඇති ආකාරය ආදිය ඇතුලත් අභ්‍යන්තර පරිසර සාධකය ........................................................................................ ලෙස හඳුන්වයි.

(32) ඇ.එ.ජනපදයේ ජනාධිපති වරයෙකු වූ ජෝජ් F කෙනඩි මහතා විසින් (i)..................................................
(ii)........................................................................(iii)..................................................................
(iv)...................................................................... යනාදිය පාරිභෝගික අයිතිවාසිකම් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.

(33) (අ) පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් ආරම්භකර පවත්වාගෙන යන ව්‍යාපාර ඇතුලත් වනුයේ
.............................................................................................................. ව්‍යාපාර ගණයටය
(ආ) ........................................................................... යනු කිසියම් නිෂ්පාදිතයක් පිළිබඳව නිෂ්පාදනය සේවාව හෝ විකිණීම පිළිබඳ සමාගමක් සතු අයිතිය වෙනත් ව්‍යාපාරයකට පැවරීමයි.

(34) (අ) සීමා සහිත සමාගමකට නෛතික පුද්ගල භාවය හිමි වනුයේ සමාගම් පණතින් සහ ..............................................
........................................................................ මගිනි.

(ආ) ව්‍යාපාර කටයුතු වලට ක්‍රියාකාරීව සහභාගී නොවන එසේම හවුල්කරුවකු බව ප්‍රසිද්ධියේ හෙලි නොකරන හවුල්කරු .......................................................................................... යන නමින් හඳුන්වයි.

(35) (අ) ආරක්ෂිත ජාලයක් තුල පුද්ගලයින්ට සන්නිවේදනය හා දත්ත හුවමාරු කිරීමට අවකාශ ලැබෙන බාහිර සන්නිවේදන ජාලය ...................................................................... ලෙස හැඳින්වේ.

(ආ) නිර්නාමික ලිපි, නිර්නාමික දුරකථන ඇමතුම් වැනි ක්‍රම සලකනුයේ ............................................................ සන්නිවේදනය ලෙසිනි.

(36) රටක ජාත්‍යන්තර වෙළදාමේ ස්වභාවය විශ්ලේෂණයට යොදා ගත හැකි මිණුම් දෙකක් ලෙස
1 ........................................................................ 2 ........................................................................ දැක්විය හැකිවේ.

(37) මෙහෙයවීමේ ක්‍රියා වලියේ ප්‍රධාන කාර්යයන් ලෙස 1..........................................................................................
2 .............................................................................................. 3 ..............................................................................
වශයෙන් කොටස් තුනක් දැකිය හැකි වේ.

(38) නිෂ්පාදන ක්‍රියාවලිය යෙදවුම් පරිවර්ථන හා නිමවුම් යන කාර්යයන්ගේන් සමන්විත වන අතර පරිවර්තන ක්‍රියාවලියට 1.එකලැස් කිරීම 2. ක්‍රියාපටිපාටි 3...................................................................................................
4 ......................................................................................................... යන දෑ අයත් වේ.

(39) (අ) නිෂ්පාදිතයක අන්තර්ගත පාරිභෝගික තෘප්තිය කෙරේ බලපාන්නාවූ ගුණාංගවල එකතුව ......................................
....................................................................................... ලෙස හැඳින්වේ.
(ආ) සෑම නිෂ්පාදිත ඒකකයක්ම 100% නිවැරදි ලෙස නිෂ්පාදනය කරන බව සහතික කරනු ලබන ශිල්පක්‍රමය
.................................................................................... ලෙස හැඳින්වේ

(40) (අ) එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍යකරන අරමුදල් ..................................................................
අවශ්‍යතා ලෙස හඳුන්වයි.
(ආ) ණය ප්‍රාග්ධනය හා අයිතිකරු ප්‍රාග්ධනය අතර පවත්නා අනුපාතික සම්බන්ධතාව ..................................................
.......................................................................ලෙස හඳුන්වයි.

- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

(41) පාරිබෝගික වගකීම් 4 ක් නම් කරන්න
(1) ................................................................................................................................
(2) ................................................................................................................................
(3) ................................................................................................................................
(4) ................................................................................................................................

(42) කුඩා ව්‍යාපාර සඳහා රජය විවිධ මූල්‍යමය නොවන දිරිගැන්වීම් ලබාදේ. ඒවාට නිදසුන් 4 ක් දක්වන්න.
1 .......................................................................... 2 ..........................................................................
3 .......................................................................... 4 ..........................................................................

(43) කුඩා ව්‍යාපාරවල අසාර්ථකත්වයට බලපාන හේතු 4 ක් සඳහන් කරන්න.

1 .................................... 2 ....................................

3 .................................... 4 ....................................

(44) නිදහස් විදේශ වෙළඳාම සීමා කිරීමට අනුගමනය කරන උපක්‍රම හතරක් සඳහන් කරන්න.

1 .................................... 2 ....................................

3 .................................... 4 ....................................

(45) (අ) අන්තර් ජාතික වෙළඳාමේ ව්‍යාප්තියට බලපෑ ප්‍රධාන හේතුව කුමක්ද?

....................................

(ආ) රටක වෙළඳ ශේෂය ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන්නේ රටේ මුළු අපනයන ආදායමත් මුළු ආනයන වියදමත්ය. මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේද?....................................

(46) ව්‍යාපාර ආයතනයක සන්නිවේදනය සිදුවන ආකාර 4 ක් දක්වන්න.

1 .................................... 2 ....................................

3 .................................... 4 ....................................

(47) විකුණුම් ප්‍රවර්ධනය බෙදෙන ප්‍රධාන කොටස් තුන නම් කරන්න

1 .................................... 2 ....................................

3 ....................................

(48) (අ) සන්නමක් ලියාපදිංචි කර නීත්‍යානුකූල තත්වය ලබාගත් විට එය හඳුන්වන්නේ කුමන නමකින්ද?

....................................

(ආ) නිෂ්පාදිතයක් මිළ කිරීමේ අරමුණු හතරක් නම් කරන්න.

1 .................................... 2 ....................................

3 .................................... 4 ....................................

(49) (අ) කාර්මික ආරවුලක් යනු කුමක්ද?

....................................

....................................

(ආ) මානව සම්පත් කළමනාකරණ කාර්ය ඇගයීම සඳහා භාවිතා කළ හැකි නිර්ණායක දෙකක් නම් කරන්න.

1 ....................................

2 ....................................

(50) මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමේ ප්‍රයෝජන 4 ක් දක්වන්න.

1 .................................... 2 ....................................

3 .................................... 4 ....................................